PR/2021/S 36

# ජපාන තානාපති කාර්යාලය


නො. 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
දුරකථනය: +94-11-269-3831 – 3, ෆැක්ස්: +94-11-269-8629
විද්‍යුත් තැපෑල: cultujpn@sltnet.lk


2021 ඔක්තෝබර් මස 28 වන දින

**පුවත්පත් නිවේදනය**

**තානාපති සුගියම මහතා, ශ්‍රී ලංකා රජයේ ත්‍රස්ත මර්දන ප්‍රයත්නය සඳහා ජපාන අධාර ප්‍රදානය කිරීමේ උත්සවයට සහභාගී වෙයි**

2021 ඔක්තෝබර් 28 වන දින, ජනාධිපති ලේකම් කාර්යාලයේදී, ශ්‍රී ලංකාවේ ජපාන තානාපති, අතිගරු සුගියම අකිරා මහතා විසින්, මුර සංචාරක යතුරුපැදි 150 ක් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත ප්‍රදානය කරන ලදී. 2019 වසරේදී ඇතිවූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාව විසින් ගෙනයනු ලබන ත්‍රස්ත මර්දන ප්‍රයත්නය සඳහා, ජපාන රජය විසින් මෙම යතුරුපැදි ශ්‍රී ලංකා පොලීසිය වෙත ප්‍රදානය කරන ලදී.

මහජන ආරක්ෂක අමාත්‍ය ගරු සරත් වීරසේකර, පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න යන මහත්වරු ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසක් මෙම උත්සව අවස්ථාවට සහභාගී වූහ.

ජපාන යෙන් බිලියනයක් (රුපියල් බිලියන 1.7ක්) වටිනා මෙම ආධාර ප්‍රදානයන් යටතේ, ජපාන රජය විසින් දැනටමත් ත්‍රස්ත විරෝධී නිරීක්ෂණ සහ විමර්ශන රථ මෙන්ම ජංගම එක්ස් කිරණ යන්ත්‍ර, ආරක්ෂක පරීක්ෂණ ගේට්ටු හා වාහන වැනි ආරක්ෂණ පරීක්ෂණ පද්ධති ඇතුළු ප්‍රතිත්‍රස්ත හා මහජන ආරක්ෂක හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය උපකරණ රාශියක් ශ්‍රී ලංකා පොලීසිය හා සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත පරිත්‍යාග කර ඇත.

ලබන වසරේදී ජපානය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ කර වසර 70ක් සපිරේ. ශ්‍රී ලංකාවේ දිගුකාලීන මිතුරෙකු ලෙස, ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේදී ජපානය ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලබයි.

(සමාප්තයි)

*************************************

වැඩි විස්තර සඳහා කරුණාකර විමසන්න,
ආර්ථික සහයෝගීතා අංශය, ජපාන තානාපති කාර්යාලය.
දුරකථන: 011-269-3831 – 3 (දිගු අංකය: 224)